00150

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන 2023/2024
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2023
**SNE5546/ESE5246 -** අන්තර්කරණ පන්තිකාමරවල සිටින දරුවන් සඳහා මනා අධ්‍යාපන පරිසරයක් නිර්මාණය කිරීම.

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2025.02.02 · වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 01 වන කොටස

01. අන්තර්කරණ පන්ති කාමරයක 'විවිධත්වය' යන්නෙහි අදහස පැහැදිලි කරන්න.

02. "විෂයමාලා විවිධාංගීකරණය" යන පදය විස්තර කරන්න.

03. අන්තර්කරණ පන්ති කාමරයක සිසුන් විනයවත් කිරීම සඳහා ගුරුවරුන් තුළ තිබිය යුතු ගුණාංග පහක් (05) සඳහන් කරන්න.

04. අන්තර්කරණ පන්ති කාමරයෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන්ගේ රුචිකත්වය මත පදනම්ව භාවිත කළ හැකි උපාය මාර්ග දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

05. "සැලසුම් පිරමීඩය" සංකල්පය උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

06. විවිධ අන්තර්කරණ අධ්‍යාපන ආකෘති කෙටියෙන් පැහැදිලි කරන්න.

07. සමාජීය හා චිත්තවේගීය ගැටළු සහිත සිසුන්ගේ ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

08. ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ රජයේ පාසල්වල අන්තර්කරණ සැකසුම ක්‍රියාත්මක කිරීමට ඇති බාධක මොනවාද?

(ලකුණු 05X08=40)

## 02 - කොටස

09. (i.) සිසුන්ගේ විවිධ ඉගෙනුම් විලාසයන් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) ගුරුවරයෙකු ලෙස, ඔබ අන්තර්කරණ පන්ති කාමරයක සිසුන්ගේ "සූදානම" සඳහා ආමන්ත්‍රණය කරන්නේ කෙසේද? උදාහරණ සපයන්න. (ලකුණු 07)

(iii.) ශ්‍රී ලංකාවේ පාසල් සන්දර්භය තුළ ඵලදායි අන්තර්කරණ පරිසරයක් සංවර්ධනය කිරීමේ පියවර විස්තර කරන්න. (ලකුණු 08)



109

10. (i.) හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධිය පිළිබඳ න්‍යාය උදාහරණ සපයමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) අන්තර්කරණ පන්ති කාමර ගුරුවරයෙකුට, විවිධ හැකියාවන් ඇති දරුවන්ට පහසුකම් සැලසීම සඳහා හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධිය පිළිබඳ න්‍යාය භාවිත කළ හැකි ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) අන්තර්කරණ පන්ති කාමර ගුරුවරයෙකු ලෙස, අන්තර්කරණය සම්බන්ධයෙන් ප්‍රජාවෙන් ලැබෙන නිෂේධාත්මක ආකල්ප සඳහා ආමන්ත්‍රණය කළ හැකි ආකාරය උදාහරණ සමඟ විස්තර කරන්න. (ලකුණු 08)

11. (i.) ශාරීරික දඬුවම්වල ප්‍රතිවිපාක පහක් **(05)** සඳහන් කරන්න. (ලකුණු 05)

(ii.) අන්තර්කරණ පන්ති කාමරයක සිසුන් විනයවත් කිරීමේ දී ගුරුවරයාගේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 07)

(iii.) අන්තර්කරණ පන්ති කාමර සැකසුම් තුළ නීති කඩ කරන සිසුන්ට මෘදු විනය ක්‍රම (Mild Disciplinary methods) භාවිත කළ හැකි ආකාරය උදාහරණ සපයමින් විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

12. (i.) විෂයමාලා විවිධාංගීකරණයට බලපාන සාධක කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) "අන්තර්කරණ පන්ති කාමරවල දුබලතා සහිත දරුවන් සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී සහ සංවිධානය කිරීමේදී ගුරුවරුන්ට ඔවුන්ගේ ඉගෙනුම් විලාසයන් හඳුනා ගැනීම වැදගත් වේ." මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 07)

(iii.) අන්තර්කරණ පන්ති කාමර ගුරුවරයෙකු ලෙස, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ "සූදානම", සහායක තාක්ෂණය භාවිතයෙන් වැඩි දියුණු කළ හැකි ආකාරය සුදුසු උදාහරණ සමඟ විස්තර කරන්න. (ලකුණු 08)

13. (i.) අන්තර්කරණ පන්ති කාමර ගුරුවරුන් සංවර්ධනය කළ ගත යුතු නිපුණතා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) අන්තර්කරණ පන්ති කාමරවල ධනාත්මක චිත්තවේගීය පරිසරය වැඩිදියුණු කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) අන්තර්කරණ පන්ති කාමර ගුරුවරයෙකු ලෙස, අඛණ්ඩ ගුරු පුහුණුව, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රයෝජනවත් විය හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 08)

14. (i.) මාර්ස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය පිළිබඳ න්‍යාය අන්තර්කරණ පන්ති කාමරයක සිසුන් තුළ "පෙළඹවීම" ඇති කිරීම සඳහා, ගුරුවරුන්ට, භාවිතා කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේදී දෙමාපියන්ගේ සහ ප්‍රජාවේ සහභාගිත්වයෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 07)

(iii.) ගුරුවරුන්ට පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලියේදී, සම-ඉගැන්වීමේ ක්‍රම භාවිත කළ හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 08)

*- සියලුම හිමිකම් ඇවිරිණි. -*



110